# 2025.06.27 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාව
# වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

<u>සහභාගි වූ මන්ත්‍රීවරුන්</u>

1. ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රි ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රි එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රි කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රි බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රි ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
8. ගරු මන්ත්‍රි ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
9. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
10. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
11. ගරු මන්ත්‍රි ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
12. ගරු මන්ත්‍රි කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
13. ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මයා
14. ගරු මන්ත්‍රි ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
15. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
16. ගරු මන්ත්‍රි සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
17. ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
18. ගරු මන්ත්‍රි ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
19. ගරු මන්ත්‍රි ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
20. ගරු මන්ත්‍රි කේ.එල්.සමන් රෝහිත මයා
21. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
22. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
23. ගරු මන්ත්‍රි එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
24. ගරු මන්ත්‍රි ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
25. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
26. ගරු මන්ත්‍රි ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
27. ගරු මන්ත්‍රි කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
28. ගරු මන්ත්‍රි ඒ.ඒ.චොහාන් සංදීප් මයා
29. ගරු මන්ත්‍රි කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
30. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය
31. ගරු මන්ත්‍රි ඒ.එච්.ගාමිණි රෙක්ස් ප්‍රනාන්දු මයා
32. ගරු මන්ත්‍රි ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
33. ගරු මන්ත්‍රි ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
34. ගරු මන්ත්‍රි ඩී.මලිත් සමීර පෙරේරා මයා
35. ගරු මන්ත්‍රි ජේ.පී.උපාලි සඳසිරි මයා
36. ගරු මන්ත්‍රි එස්.ඒ.අජිත් අමරජීව මයා
37. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය

38. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
39. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය
40. ගරු මන්ත්‍රි සුධීර ප්‍රදීප් රණසිංහ මයා
41. ගරු මන්ත්‍රි එස්.ඒ.දීපාල් මයා
42. ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
43. ගරු මන්ත්‍රි ඩබ්.විමලසිරි පෙරේරා මයා

<u>සහභාගි නොවූ මන්ත්‍රීවරුන්</u>

1. ගරු මන්ත්‍රි ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා

මෙදින පෙ.ව 9.00ට ආගම සිහි කිරීමෙන් පසු මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීම් ශාලාවේදි ආරම්භ විය.
.

**1. 2025.06.13 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.06.13 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව සත්‍යයක් බව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් යෝජනා කරන ලදි. එම වාර්තාවේ දිනය 2025.06.03 ලෙස මුද්‍රණ දෝෂයක් සිදු වී ඇති බැවින් එය 2025.06.13 ලෙස නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා පවසන ලදි. එම සංශෝධනයට යටත්ව ගරු මන්ත්‍රි අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන් පසු එම වාර්තාව ඒකමතිකව සම්මත විය.

2025.06.13 දින පැවති විශේෂ මහ සභාවට පසුව කාලය කළමනාකරණය කර ගනිමින් මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව, කාර්මික සේවා කාරක සභාව, ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව, පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව හා පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව පැවැත්වීමට හැකි වූ බව ගරු සභාපතිතුමා පවසන ලදි. ඒ සඳහා උද්යෝගයකින් යුතුව පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රිවරුන් පැමිණීම පිළිබඳව ගරු සභාපතිතුමා ස්තුතිය පුද කරන ලදි. එලෙස කාරක සභා මඟින් වාද විවාද කරමින් ගන්නා හොඳම තීරණ වලින් වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවට හොඳ සේවයක් කිරීමට හැකි බවත් පැවසීය.

**2. ගරු සභාපති තුමාගේ විශේෂ නිවේදන**

1. 2026 වර්ෂය සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ අයවැය යෝජනා , ලබා දී ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කර ජුනි 30 ට ප්‍රථම ලබා දිය යුතුය.

2. සභාවේ කටයුතු වලට අදාල යෝජනා හැකි සෑම විටම අදාල කමිටු හරහා ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

3. මහ සභා රැස්වීම් වලට හෝ කමිටු රැස්වීම් වලට සහභාගි වීමට නොහැකි වන අවස්ථා වලදි නිවාඩු අයදුම්පත්‍ර ගරු සභාපතිතුමාට/අදාල කමිටු සභාපතිතුමාට/ලේකම් තුමා වෙත ලබා දිය යුතුයි.
4. 2025 ජුනි මස මාසික දීමනා බැර කිරීම සඳහා බැංකු ගිණුමෙහි ඡායා පිටපතක් ජුනි 30 දිනට පෙර ලබා දිය යුතුයි.

5. ගරු මන්ත්‍රීතුමන්ලාගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙත යැවීම සඳහා කඩිනමින් ලබා දිය යුතුයි.

6. 2025 මැයි මාසයේ විදුලි පහන් නඩත්තුව පිළිබඳ ප්‍රගති වාර්ථාව හා වාහන ධාවනයට අදාල ප්‍රගති වාර්ථාව ඉදිරිපත් කර ඇත.

7. තාක්ෂණික ගැටලුවක් නිසා කර්මාන්ත කමිටු වාර්තාව ලබා දීමට නොහැකි වූ අතර එය මීලඟ මහ සභාවට ඉදිරිපත් කරන බව දැනුම් දෙන ලදි.

## 3. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

I. නයිනමඩම ක්‍රීඩාංගනය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය සඳහා පහත සඳහන් පිළිතුර ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

මෙම ක්‍රීඩා පිටිය සඳහා ඉඩම මිලදී ගැනීමට අදාලව සභාව විසින් රු.15,000,000.00 ක මුදලක් ණය හිමි ලෙස සභාවේ අයවැය මගින් වෙන් කර ඇති අතර වෙන්නප්පුව ප්‍රාදේශිය ලේකම් වෙත තැන්පත් කර තිබූ රු.3,975,000.00 ක මුදල 2024.03.25 දිනැති, අංක 551558 දරණ චෙක් පත මගින් නැවත ප්‍රාදේශිය සභාවට ලබා ගෙන ඇති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා නයිනමඩම ඉඩම මිලට ගැනීමේ කටයුතු පිළිබඳ ඇති වී ඇති තත්වය සාකච්ඡාවට ගැනීම සඳහා මහ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා විසින් ස්ථිර කරන ලදි.

නයිනමඩම කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස කටයුතු කරන ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් ඔහු වෙත විදේශගත ගම්වැසි තරුණ කණ්ඩායමක් විසින් එවන ලද ලිපියක් ඉදිරිපත් කරන ලදි. එමගින් දක්වා ඇත්තේ එම තරුණ කණ්ඩායම සභාව විසින් ඉඩම මිලදී ගැනීමෙන් අනතුරුව සිදුකල යුතු සංවර්ධන කටයුතු ඔවුන් විසින් ඉටු කර දෙන බවයි.

ඒ අනුව ලේකම් තුමා විසින් ඉහත කරුණ පැහැදිලි කරන ලදි. ඉන් පසු කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් කිරීම සඳහා ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා විසින් ස්ථිර කරන ලදි.

## 4. යථා පරිදි කල් දී ඇති යෝජනා

1. 2025 වර්ෂයේ 3 වන පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධූෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

2. වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පොදු වෙළඳපොල සීමාවන් ප්‍රකාශයට පත් කරමින් නිකුත් කර ඇති නිවේදනය අවලංගු කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා කතා කරමින්, වෙළඳපොල ආසන්නයේ සීමාවක් තීරණය කර එම සීමාවන් තුල එළවළු, පළතුරු, කරවල ආදිය වෙළදාම් කිරීම තහනම් කරමින් 2018,2019 වර්ෂවලදී තීරණයක් ගත් බවත් එලෙස තීරණයක් ගනු ලැබුවේ වෙළඳපොල තුල වෙළදාමේ යෙදෙන කුඩා වෙළඳුන් ආරක්ෂා කර ගැනීම සඳහාත් වෙළඳපොල තුලින් ප්‍රාදේශිය සභාවටද ආදායමක් ලබා ගැනීමේ අරමුණින් බව අවධාරණය කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා කතා කරමින්, ආණ්ඩුකාරවරයා එවා ඇති ලිපිය අනුව එම ලිපිය 2024.09.11 දිනැතිව යැවූ ලිපියක් බැවින් එය කවුරුන් විසින් යවා ඇති ලිපියක්ද යන්න සහ සීමා නිර්ණය සභාවෙන් ගත් තීරණයක් බවත් එම තීරණය ඉවත් කිරීමට මෙවැනි කවුරුන් හෝ යැවූ ලිපියක් පදනම් කරගෙන කල නොහැකි බව පවසන ලදි. එමෙන්ම සභාවට ලැබෙන ආදායම අඩු කර ගත යුතුද? වැටුප් පරිපූර්ණය අඩු වී ඇති තත්වයකදී මෙලෙස ක්‍රියා කිරීම සුදුසුදැයි ඔහු විමසා සිටින ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා කතා කරමින් මෙලෙස සීමා පනවමින් එක් එක් ප්‍රදේශ වලට නීති පනවා කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදි රටකට නොගැලපෙන බව එතුමාගේ අදහස බව ප්‍රකාශ කරන ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා කතා කරමින්, විවෘත වෙළපොල ආර්ථික ක්‍රමයක් තුල ඕනෑම අයෙකුට වෙළඳ ව්‍යාපාරයක් කිරීමේ අවස්ථාවක් ලබා දිය යුතු බව පවසන ලදි. එලෙසම විවිධ ක්‍රම නිසා එවැන්නන් හට අසාධාරණයක් කල නොහැකි බවද පැවසීය. ඒ සමඟින් වෙළඳපොළ ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේදයක් වෙනම ක්‍රියාත්මක කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා කතා තරමින්, සෑම දෙයකටම විරුද්ධ වීම නොකල යුතු අතර ජනතාවට යහපතක් සිදු වන වැඩ පිලිවෙලකට සහයෝගය ලබා දීම අපගේ යුතුකම බවත් ජනතාව බලාපොරොත්තු වන වෙනස්කම් අප ඉටු කල යුතු බවද ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා කතා කරමින්, මෙම සතිපොල තවමත් වර්ෂ 20කට 30 කට පෙර තිබූ අයුරින්ම තවමත් තිබෙන අතර වහලය හා බිම පමණක් මේ වන විට වෙනස් වී ඇති පව පවසන ලදි. එනමුත් බිම එළවළු තබාගෙන වෙළදාම් කරන වෙළෙන්දාට පාරිභෝගියාට ප්‍රියමනාප ආකාරයෙන් වෙළදාම් කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට හැකි තත්වයට පත් කල යුතු බව පවසන ලදි. එමෙන්ම වෙන්නප්පුව නගරයට අත්‍යවශ්‍ය වන රථ ගාලක් නිර්මාණය කර අත්‍යවශ්‍ය පහසුකම් වැඩිකර දුන් විට වෙළෙඳපොලට ජනතාව ඇදී ඒම වැලැක්විය නොහැකි බවද පවසන ලදි. එමෙන්ම ටෙන්ඩර්කරුවන් විසින් වෙළඳුන්ට සිදු කරන තාඩන පීඩන වලින් ඔවුන් ගලවා ගැනීමටද කටයුතු කිරීම අපගේ යුතුකමක් වන බවද ප්‍රකාශ කලේය.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා යන මන්ත්‍රීවරු 05 දෙනා යෝජනාවට විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි. අනෙකුත් බහුතර මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත යෝජනාව සම්මත විය.

3. පෞද්ගලික යතුරු පැදි භාවිතා කරමින් ක්ෂේත්‍ර රාජකාරි වල නිරතව සිටින පහත නම් සඳහන් සේවකයින් වෙත ගමන් වියදම් වශයෙන් මාසයක් සඳහා රු.5500.00ක උපරිමයකට යටත්ව ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

| | | |
|---|---|---|
| I. | රොබට් කෙනඩි | - සෞඛ්‍ය පරිපාලක |
| ii | කල්පප සුලක්ෂණ | - සෞඛ්‍ය පරිපාලක |
| iii. | අසේල සඳරුවන් | - සෞඛ්‍ය පරිපාලක |
| iv. | අමිල පැතුම් පෙරේරා | - වැඩ පරිපාලක (රාජකාරි ආවරණය) |
| v. | ධාරක චතුරක්ෂණ | - වැඩ පරිපාලක (රාජකාරි ආවරණය) |

4. 2025 අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති කසල දහනය කිරීමේ දාහකය සෙන්දිරියාමුල්ල සන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියේ ඉදි කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

5. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ මාර්ග නඩත්තු අංශය සඳහා ටොන් 1 ක ධාරිතාවයකින් යුත් මාර්ගතලනයක් මිලදි ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

6. වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශිය සභා මාර්ග දෙපස ගමනාගමනයට අවහිර වන පරිදි සිටුවා ඇති ගස් ඉවත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි. ගරු මන්ත්‍රිනී අයි. නයෝමි රමාලතා මිය විසින් ජනපද ආශ්‍රිත තැන්වල නිවෙස් ඉදිරිපිට කාණු තුල මල් වගා කිරීම සිදු වී ඇති අතර වර්ෂා දිනවල ජලය බැස යාමේදි එය බාධාවක් වී ඇති හෙයින් ඒවාද ඉවත් කරන ලෙස යෝජනා කරන ලදි. ඒ අනුව එම යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

7. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදි ගරු මන්ත්‍රී කේ.වී. සුසන්ත පෙරේරා මයා මෙම වසරේ වැටුප් ප්‍රතිපූර්ණය පිළිබඳව විමසා සිටින ලදි. එමෙන්ම ප්‍රාදේශිය සභාව සතුව රුපියල් ලක්ෂ 1700 ක තැන්පතු මුදලක් ඇති බවත් එම මුදලින් කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීමක් සිදු වන්නේ නම් එයටද විපක්ෂයක් ලෙස විරුද්ධ වන බවයි.

එයට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා පවසා සිටියේ රජයක් ලෙස ඔවුන් බලාපොරොත්තු වන්නේ නිෂ්පාදන ආර්ථිකයක් සෑදීම බවයි. වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේදි ජනතාවගේ සංවර්ධනයට වෙන් කල මුදල් කපා දැමීමට කිසිදු අරමුණක් නොමැති බවද ප්‍රකාශ කරන ලදි. එසේ කිරීමට සිදු වුනත් එයට අවශ්‍ය ප්‍රතිපාදන මධ්‍යම රජයෙන් හෝ ලබා ගැනීමට කටයුතු කරන බවද පවසන ලදි.

ඉන් පසු ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා පවසා සිටියේ දංකොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පැවති සාකච්ඡාවකදි ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව බංකොලොත් සභාවක් ලෙස අර්තකථනය කල බවත් එමගින් වැරදි අදහසක් සමාජගත වූ බවයි. ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා එම කතාවට පක්ෂව අදහස් දක්වන ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා මෙම ගැටලුව නිරාකරණය කරමින් පවසා සිටියේ දංකොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා පවසන ලද්දේ ප්‍රාදේශිය සභාව බංකොලොත් සභාවක් බව නොව මෙම වසරේ මුදල් යම් ප්‍රමාණයක් වියදම් කර ඇති බැවින් ඉදිරියට කටයුතු කරගෙන යාමට ඇති මුදල් ප්‍රමාණය අඩු නිසා කිරීමට ඇති වැඩ ප්‍රමාණය සීමා වන බවයි.

ගරු සභාපති තුමා කතා කරමින්, දංකොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදි පැවති රැස්වීමේදි ඉදිරියට කිරීමට ඇති කටයුතු පිලිබඳ යෝජනා ඉදිරිපත් කිරීමේදි ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා හට සභාපතිතුමා විසින් පවසා සිටියේ සභාවේ සියලුම කටයුතු සිදු කරන්නේ කලින් තිබූ අයවැයට බවයි. මේ වන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත්තේ 60%කට ආසන්න ප්‍රමාණයක් බැවින් තවත් ඉතිරිව ඇත්තේ සුළු මුදල් ප්‍රමාණයක් බව පැවසූ බව ප්‍රකාශ කරන ලදි. ඒ අනුව මේ සියලුම කතා ඒ මත පදනම් වූ දේවල් බවද ප්‍රකාශ කරන ලදි.

ඉන් පසු මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් ලෙස පත් කිරීමට ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. පසුව ලේකම් තුමා මේ පිළිබඳ දීර්ඝ පැහැදිලි කිරීමක් කරමින් අවසානයේදි පවසා සිටියේ මෙම ගැටලුව කලමනාකරණය කිරීමට හැකි බවයි.

එම පැහැදිලි කිරීමෙන් පසු කාරක සභාව මහ සභා අවස්ථාවක් කරල ලෙස ගරු මන්ත්‍රීනී අයි.නයෝමි රමාලතා මිය යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ඉහත සඳහන් යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සම්මත විය.

8. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට අයත් කාර්ය ස්ථානවල විදුලි බිල්පත්, ජල බිල්පත්, දුරකථන බිල්පත් හා පුස්තකාලවල පුවත්පත් බිල්පත් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

9. වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයේ ඉගෙනුම ලබන සී. ශිවෝන් මධූෂ ප්‍රනාන්දු ශිෂ්‍යයා චීනයේ පැවැත්වෙන හොකී ආසියානු කුසලාන තරගාවලිය සඳහා යැමට සුදුසුකම් ලබා ඇති බැවින් ඒ

සඳහා වැයවන මුදල පියවා ගැනිම සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඔහුගේ මව වන ඩබ්.ඒ. සුනේත්‍රා රණසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සහ වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ ඉගෙනුම ලබන එම්.එම්.එස්. හිමංසි පීරිස් චීනයේ පැවැත්වෙන 18න් පහල ශ්‍රී ලංකා හොකී කනිෂ්ඨ කණ්ඩායමට තේරී පත් වී ඇති අතර එම තරඟාවලිය සඳහා ජුනි මස 29 චීනය බලා පිටත්ව යාමට සූදානම් වී ඇති බැවින් ඒ සඳහා වැයවන මුදල පියවා ගැනිම සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඔහුගේ පියා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය ගරු සභාපති තුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

එහිදි ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය විසින් එම ආධාර ඉල්ලා සිටින දරුවන් වෙන්නප්පුව බල ප්‍රදේශයට අයත් දරුවන් ද යන්න සලකා බැලිය යුතු බවත් එම මුදල ලබා දීමේදි කිසියම් නිර්ණායකයක් පදනම් කරගෙන කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරන ලදි.

ඒ අනුව ගරු සභාපති තුමා විසින් ඉදිරියට පැවැත්වෙන ක්‍රීඩා කමිටුවේදි මෙම නිර්ණායකයන් පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි. ඉන් පසුව ඉහත නම් සඳහන් දරුවන් සඳහා රු.25,000.00 ක් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

10. ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති තුමාට, ගරු උප සභාපති තුමාට හා ගරු මන්ත්‍රිවරුන්ට මාසික දීමනා, සන්නිවේදන දීමනා, ප්‍රවාහන දීමනා, කමිටු රැස්වීම් සඳහා දීමනා ගෙවීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

- <u>මාසික දීමනාව</u> - (අංක 1897/13 - 2015.01.16 දින දරණ ගැසට් පත්‍රය)
    - සභාපති - රු.25,000.00
    - උප සභාපති - රු.20,000.00
    - මන්ත්‍රිවරුන් සඳහා - රු.15,000.00

- <u>සන්නිවේදන දීමනා</u> - (2014.11.28 දින දරණ ගැසට් පත්‍රය)
    - රු.3000.00

- <u>ප්‍රවාහන දීමනා</u> - (අංක 2092/10 – 2018.10.08 දින දරණ ගැසට් පත්‍රය)
    - රු.3000.00

- <u>කමිටු රැස්වීම සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනාව</u> (අංක 1508/14-2007.07.31 දින දරණ ගැසට් පත්‍රය)
    - එක් කමිටුවක් සඳහා - රු.250.00
    - ඊට වැඩි වාර ගණනක් සඳහා - රු.500.00 (උපරිමය)

11. ගරු සභාපතිතුමාගේ පෞද්ගලික සහකාර තනතුරට නිලධාරියෙකු බඳවා ගැනිමට හා ඒ සඳහා නියමිත රු.22000.00 ක මාසික දීමනාව ඔහු වෙත ගෙවීමට අනුමැතිය ලබා ගැනිමට අදාල

යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**කල් දී නොමැති යෝජනා**

1. වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ එලිමහන් ප්‍රේක්ෂකාගාරයේ පඩිපෙලවල් අබලන් වී ඇති බැවින් ඒවා ඉවත් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම.

   ගරු සභාපතිතුමා පවසා සිටියේ මීට අවුරුදු 02 ට ඉහතදි දරුවෙකුට අනතුරුක් සිදු වූ අතර ඒ පිලිබඳ පරික්ෂාවක් තාක්ෂණික නිලධාරින් විසින් සිදු කල බවයි. මේ වන විට තත්ව වාර්තාවක් ලබා දෙන ලෙස ගොඩනැගිලි හා පර්යේෂන ආයතනයට ලිපියක් සූදානම් කර ඇති බවද ප්‍රකාශ කරන ලදි. ඒ අනුව එම තාක්ෂණික වාර්තාවට අනුව කටයුතු කිරීමට අවසර ලබා දෙන ලෙස යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

2. වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ කාය වර්ධන මධ්‍යස්ථානය බඳු දීම සම්බන්ධව තීරණයක් ගැනීම.

   ගරු සභාපතිතුමා පවසා සිටියේ කාය වර්ධන මධ්‍යස්ථානය මේ වන විට විශාල පිරිවැයක් දරා අලුත්වැඩියා කර තිබුනත් එයට අවශ්‍ය නවීන උපකරණ කිසිවක් නොමැති බවයි. එම උපකරණ මිලදී ගැනීමට විශාල මුදලක් වැය වන බැවින් එය බඳු දීමට හැකියාවක් පවතින බව ප්‍රකාශ කරන ලදි.

   ඒ අනුව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා විසින් කාය වර්ධන මධ්‍යස්ථානය බඳු දීමට යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන් පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

3. මැ/කිරිමැටියාන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩම වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා එකඟතාවය ලබා දීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව ඒකමතිකව සම්මත විය.

**5. කාරක සභා වාර්තා සලකා බැලීම.**

a. 2025.06.17 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා වාර්තාව

   ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා කතා කරමින්, ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයන් නියෝජනය කිරීමට විපක්ෂයෙන් සාමාජිකයින් 02ට අවස්ථාවක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. එයට පිලිතුරු දෙමින් ගරු සභාපති තුමා පවසා සිටියේ දැනට පත් කර ඇති සාමාජිකයින් පමණක් ටෙන්ඩර් මණ්ඩලයට සෑහෙන බවයි. එහි වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නොවන බවද ප්‍රකාශ කරන ලදි. එමෙන්ම ටෙන්ඩර් කමිටු වාර්ථාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ලබා දෙන බැවින් එය පරික්ෂා කිරීමට ඔවුන්ට අවස්ථාව ලැබෙන බවද ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි.

## 6. ආදායම්/වියදම් වාර්තා සලකා බැලීම

a. 2025 ජනවාරි සිට අප්‍රියෙල් මස ආදායම් වාර්තාව

b. 2025 මැයි මස වියදම් වාර්තාව
ඉහත සඳහන් වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳව ගැටලුවක් ඇත්නම් විමසන ලෙස ගරු සභාපති තුමා විසින් ප්‍රකාශ කල නමුත් ඒ පිළිබඳ ගැටලුවක් ඉදිරිපත් නොවීය.

## 7. වෙනත් කරුණු

1. දිගු කාලයක් ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කල සරත් වික්‍රමරත්න මහතා වෙනුවෙන් සහ පසුගිය සභාවේ සිටි ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයෙක් වන ගෝඨභය වික්‍රමසිංහ මහතා වෙනුවෙන් ශෝකය පල කිරීම.

ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කල සරත් වික්‍රමරත්න මහතා, ගෝඨභය වික්‍රමසිංහ මහතා සහ හිටපු අමාත්‍ය මිල්රෝයි පෙරේරා යන මන්ත්‍රීවරුන් වෙනුවෙන් ශෝකය පල කිරීම සඳහා මීලඟ මහ සභාවේදි එම පවුල්වල අය වෙත මෙහි පැමිණෙන ලෙස ආරාධනාවක් යවා ඔවුන් ගෙන්වා එම මන්ත්‍රීවරුන්ගේ සේවය ඇගයීමක් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා කතා කරමින්, වෙන්නප්පුව සතිපොල ගැටලුව ඉදිරිපත් කරන ලදි. සභාවේ නිලධාරින් හා තක්සේරු නිලධාරින්ගේ ක්‍රියාවලින් අනතුරුව ටෙන්ඩර් ලබා දී ඇති නමුදු ටෙන්ඩර් පටිපාටිය අනුව මුදල් ගෙවීම සිදු වී නොමැති බවත් නඩුවක් ගොනු කර ඇති බවත් ප්‍රකාශ කලේය.

ඉන් පසු මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් ස්ථිර කරන ලදි.

ලේකම් තුමා කතා කරමින්, ප්‍රාදේශිය සභාවට අයත් පොදු වෙළඳපොලවල් වන දංකොටුව, වෙන්නප්පුව, ලිහිරියාගම සහ සිරිගම්පල ටෙන්ඩර් ලබා ගත් අතර කිරිමැටියාන පොළ සඳහා ටෙන්ඩර් ලබා නොගත් බවත් එම පොලවල් අතරින් දංකොටුව, ලිහිරියාගම සහ සිරිගම්පල කිසිදු ගැටලුවක් නොමැතිව අදාල බදු මුදල් යටතේ ගිවිසුම්ගතව එම කටයුතු සිදු කරගෙන යන අතර වෙන්නප්පුව පොදු වෙළඳපොල ටෙන්ඩර් ලබා ගත් අය විවිධ ගැටලුකාරි තත්වයන් ඉදිරිපත් කරමින් ගිවිසුම් කොන්දේසි වලින් බැහැරව කටයුතු කරන බව පැහැදිලි කරන ලදි. ඔවුන් අධිකරණ කටයුත්තකට ගොස් ඇති අතර මුදල් අධිකරණයට ගෙවීමට ඉල්ලා ඇති නමුත් අප ඒ සඳහා විරෝධතාවයක් ඉදිරිපත් කල බැවින් නැවත අදාල මුදල් සභාවට ගෙවීමට තීරණය

ලබා දී ඇත. තවද මුදල් ගෙවීම පිළිබඳව හා ලැබී ඇති මුදල් විශ්ලේෂණය කල විට රුපියල් ලක්ෂ 02 ක පමණ ඌනතාවයක් දක්නට ලැබි අතර සභාවක ලෙස අපගේ ස්ථාවරය වන්නේ ගිවිසුම්ගතව සිටින පාර්ශවය ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු වන අතර එසේ ක්‍රියා කිරීමට නොහැකි නම් ගිවිසුමෙන් ඉවත් විය යුතු බවයි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා කතා කරමින්, කොමසාරිස් තුමියගේ උපදෙස් වලට යටත්ව මෙම නඩුව අවසන් කර ගැනීම සභාවට යෝග්‍ය වන බවත් එසේ නොවුනහොත් සභාවට විශාල හානියක් විය හැකි බැවින් සාකච්ඡා කර අවසන් කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ලේකම් තුමා කතා කරමින්, වාරණ නියෝගය ඊලඟ නඩු වාරයේදි අවසන් වුවහොත් ගිවිසුම් කොන්දේසි කඩකර ඇති නිසා ගිවිසුම්ගතවීම අවලංගු කිරීමේ හැකියාවක් සභාවට ඇති බව පවසන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපති තුමා අදහස් ප්‍රකාශ කරමින් මීට පෙර පැවති ක්‍රමය පිලිබඳව වාද විවාද කරමින් කාලය ගත කිරීම නිෂ්ඵල වන අතර සභාවට අගතියක් නොවෙන ලෙස න්‍යාය පත්‍රයට අදාල කරුණු පමණක් සාකච්ඡා කිරීමට අප සියලු දෙනා වග බලා ගත යුතු අතර සභාවේ මලසුනට හා සභාවේ මන්ත්‍රිවරුන් වෙත ආමන්ත්‍රණය කිරීම පිලිබඳව දැනුවත් වීම සඳහා නැවත රීති පොත අධ්‍යනය කර පැමිණෙන ලෙස යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය කතා කරමින්, බ/කහටවිල සුසාන භූමිය පිලිබඳ ගැටලුවක් ඉදිරිපත් කරන ලදි. එනම් කහටවිල විහාරස්ථානයේ විහාරාධිපති හා ගම්වැසියන් එකතු වී ගත් යෝජනාවක් (දේහයක් භූමදානය කිරීමේදි සුසාන භූමිය තුල වල බැදීමක් සිදු කිරීමට ඉඩ නොදීම) 2021.11.11 දින වූ මහ සභාවට ඉදිරිපත් කර තිබූ අතර ඉන් පසුව මෙම වසරේද එම ඉල්ලීම කඩ කරමින් වල බැදීමට අවසර දී තිබුණි. ඒ සඳහා අවසර ලැබුනේ කාගෙන්ද සහ මෙම ගැටලුවට පිලිතුරු මීලඟ සභා වාරයේදි බලාපොරොත්තු වන බවද පවසන ලදි.

එමෙන්ම මැල්වත්ත දියවර ක්‍රීඩා පිටිය තුල සිදු වූ සිද්ධියක් නිසා සභාව සතු ක්‍රීඩා පිටි සඳහා කුඩා දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සුදුසු බවද යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා කතා කරමින්, කිරිමැටියාන කොට්ඨාසයේ අබලන් වී ඇති පාරවල් පිලිසකර කර දෙන ලෙසත් ආදාහනාගාරයෙන් පිටවන දුම් නිසා අවට ගම්වාසින් දැඩි පීඩාවට පත් වී ඇති බැවින් ආදාහනාගාරයේ කුලුන හැකිනම් තව අඩි 10ක් ඉහලට ඔසවා දෙන ලෙසත් ආදාහනාගාරයේ නම එක එක් අය විවිධ ලෙස නම් කර ඇති බැවින් එය "කිරිමැටියාන ආදාහනාගාරය" ලෙස නම් කර දෙන මෙන් ඉල්ලීමක කල අතර මංගලිකා ක්‍රීඩාංගනයේද ජල, විදුලි ආදි කිසිදු පහසුකමක් නොමැති බැවින් ඒ පිලිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව පක්ෂ භේදයකින් තොරව මහ ජනයාට සේවය කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසත් සියලු කටයුතු සඳහා තමාගේ සහයෝගයද ලබා දෙන බවත් ප්‍රකාශ කලේය.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා කතා කරමින්, නැ/කහටවිල කොට්ඨාසයේ ඉතා දිළිඳු අසරණ පවුල් කිහිපයක් ජීවත් වන බැවින් ඔවුන් සමහර අයට බීමට ජලය නොමැති අතර වැසිකිලියක් පවා ඉදි කර ගැනීමට නොහැකි තත්වයන් ඇති අයද සිටි. එමෙන්ම දරුවන් පාසල් යාමද

අතහැර දමා ඇති බවක් දක්නට ලැබෙන අතර එම ජනතාවට සහනයක් සහ අත්වැලක් ලබා දිය හැකි නම් අගනා බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා කතා කරමින්, දැනට බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වෙමින් පවතින විදුලි ජනක පද්ධතියක් ඇති බවත් western power නමින් නම් කර ඇති මෙමගින් එම පළාතේ එකතු වන කසල දහනය කිරීමෙන් නිකුත් වන තාපය උපයෝගී කරගෙන විදුලිය නිපදවීමක් මුතුරාජවෙල සිදු කරමින පවතින බව ප්‍රකාශ කරන ලදි. පසුගිය කමිටුවකදී අප සභාව වෙත කසල දහනය කිරීමේ යන්ත්‍ර සවි කිරීම සඳහා ඇති අවශ්‍යතාවය පෙන්වා දී තිබූ බවත් එවැනි වාතාවරණයක් යටතේ නිකරුනේ කසල පුලුස්සා දැමීමට වඩා ඉහත western power ක්‍රියාවලිය සිදු කිරීම මඟින් වඩා ප්‍රතිඵල ලබා ගැනීමට හැකි බවත් ජනනය වන විදුලිය විදුලි බල මණ්ඩලය වෙත ලබා දීමෙන් ආදායමක්ද ලැබෙන බැවින් එම ක්‍රියාවලිය පරික්ෂා කර බැලීම සඳහා අධ්‍යන චාරිකාවක් යාම සුදුසු බව යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා කතා කරමින්, වීදි පහන් අක්‍රිය වීමකදී දැනුම් දීම සඳහා පහසු වන පරිදි කණු අංක කිරීම පෙරදී සිදු කල ලෙස නැවත සිදු කිරීම සුදුසු බව යෝජනා කරන ලදි. එමෙන්ම වීදි පහන් සඳහා සෝලා ක්‍රමයක්ද අනුගමනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, ඉදිරියේදී විගණනයක් කිරීමට බලාපොරොත්තු වන බවත් මින් ඉදිරි සභා කටයුතු වලදී වෙනත් කරුණු යටතේ ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙසත් ඒ සඳහා අදාල කමිටු වල සාකච්ඡා කර එමගින් තව දුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය නම් න්‍යාය පත්‍රයට ඇතුලත් කර ගත හැකි බවත් ඉතාම අත්‍යවශ්‍යම කරුණක් පමණක් වෙනත් කරුණු යටතේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන බව ප්‍රකාශ කලේය.

ඉන් පසු සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 12.30ට පමණ මහ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

# 2025.06.27 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන

## යථා පරිදි කල් දී ඇති යෝජනා (1)

වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පොදු වෙළඳපොල සීමාවන් ප්‍රකාශයට පත් කරමින් නිකුත් කර ඇති නිවේදනය අවලංගු කිරීමට අදාල සාකච්ඡාවේදි ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා පවසා සිටියේ ගරු සභාපතිතුමා ඇතුළු පක්ෂ මන්ත්‍රීවරුන් එමඟින් සිදු වන අලාභානියේ වගකීම භාර ගන්නේ නම් විපක්ෂයක් ලෙස එතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම එම නිවේදනය අවලංගු කිරීමට එකඟතාවය ලබා දෙන බවයි.

## 5. කාරක සභා වාර්තා සලකා බැලීම

ටෙන්ඩර් මණ්ඩලයට පක්ෂ සාමාජිකයන් පමණක් පත් කිරීම පිලිබඳව ගරු සභාපතිතුමා පැහැදිලි කල අතර ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා විසින් එම කරුණ ස්ථිර කරමින් “කිරි කලයට ගොම බිංදුවක් එක් කිරීමට අකමැති” බව පවසමින් අදහසක් ප්‍රකාශ කරන ලදි. එම අදහසට විරෝධය පල කරමින් ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය පවසා සිටියේ “කිරි කලයට ගොම බිංදුවක් එක් කිරීම” යන අරුතෙන් විපක්ෂය නියෝජනය වන අතර වර්තමාන මන්ත්‍රීමණ්ඩලය තුල වැඩි ප්‍රතිශතයක් සිටින්නේ නවක මන්ත්‍රීවරුන් වන බැවින් කාන්තාවන් නියෝජනය කරන මන්ත්‍රීවරියක් ලෙස එම අදහසට විරුද්ධ බවයි.

## 7. වෙනත් කරුණු

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා කතා කරමින්, වීදි පහන් අක්‍රිය වීමකදි දැනුම් දීම සඳහා පහසු වන පරිදි කණු අංක කිරීම පෙරදි සිදු කල ලෙස නැවත සිදු කිරීම සුදුසු බවත් වසරකට 10%ක සෝලා විදි පහන් ක්‍රියා කිරීමේ සැලසුමක් යොදා ගැනීමටද යෝජනා කරන ලදි.